විනිවිද දකින්නට ජනතාවට බලය හිමිවන තොරතුරු දැනගැනීමේ අයිතිය

අධිකරණ අමාත්‍ය සහ ශ්‍රී ලංකා ජාතික සංගමයේ නායක

මිලින්ද මොරගොඩ විසිනි

> ලෝකයේ රටවල් ගණනාවක් දැනටමත් ස්වකීය මහජනතාවට මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර දී තිබේ. ඉන්දියාව, බංගලාදේශය හා පාකිස්තානය වැනි රටවල් මේ හා සමාන නීති රීති ගෙනැවිත් ඇති අතර චීනය, කොරියාව, තායිලන්තය හා ජපානය වැනි ආසියාතික රටවලද තොරතුරු දැනගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර ඇත. ඉන්දියාවේ දැනට ක්‍රියාත්මක වන මෙම පනත අනුව මහජනතාවගෙන් නැගෙන ඉල්ලීම් ගැන දිනපතාම පාහේ වාර්තා වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදී රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ අපට නීතියක් තිබේ. මෙම නීතිය රටට හඳුන්වාදී ඇත්තේ බටහිර සමාජයයි. සියවස ගණන අධිරාජ්‍යවාදීන් විසින් මෙරට ඇති කළ නීති පද්ධතිය නොයෙක් අවස්ථාවල සංශෝධනයන්ට ලක් වෙතත් එහි මූලික රාමුව රටට අනන්‍ය පරිදි වෙනස් වී නැත. නීතිය කුමක්ද? නීතිය මගින් සැමවිටම යුක්තිය ඉටුවේද? යන ප්‍රශ්න මහජනතාව තුළ ඇත.

මහජනතාව අතුරින් බහුතරයක් වැරදි කරන්නට බියවෙයි. ඔවුන් ඒ නීතියට දක්වන බිය නිසාය. රටට අවශ්‍ය නීතිය ඉදිරියේ නීතියට පත්වන පුරවැසියන් නොවේ. මහජනතාව නීතියට ගරු කළයුතුය. නීතිය කුමක්ද? එය ආරක්ෂා නොකළහොත් තමන් පුද්ගලයකුට විඳින්නට සිදුවන හිරිහැරය කෙබඳුද යන යථාවබෝධය සමාජය විසින් ඇති කරගත යුතුය.

රටේ නීතිය පවතින්නේ සුළුතරයක ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීමට නොවේ. එහි සියලු පුරවැසියන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම අවශ්‍යයි. මහජනතාව වෙනුවෙන් සාධාරණ තීන්දු මත යුක්තිය පසිඳලන්නට නීතියට හැකියාව ලැබිය යුතුය. වර්තමානයේ මහජනතාව නීතියේ පිළිසරණ ලබන්නට වනාම උනන්දු නැත. එයට ගත වන කාලය, එහි ඇති වියදම හෝ යුක්තිය වෙනුවට නීතිය හරහා ලැබෙන තීන්දුව ගැන විශාල බලාපොරොත්තුවක් මහජනතාව තුළ නැති වීම මෙහි ලා බලපා ඇති ප්‍රධාන කාරණාවයි.

පොදු මහජනතාවගේ සෑම කටයුත්තකදීම දේශපාලනය හෝ රජය මැදිහත් වෙයි. පාසලට දරුවෙකු ඇතුළත් කරන්නට, රැකියාවක් හෝ උසස්වීමක් දෙන්නට, මාවතක් හෝ ඇළ මාර්ගයක් පිළිසකර කරන්නට, ඒ පිළිසකර කරන ලද පොදු ව්‍යාපෘතිය විවෘත කරන්නට ආණ්ඩුවක්, ආණ්ඩුවේ දේශපාලනඥයන් මුල් තැන ගත යුතුය. එය දැනට පවතින සම්ප්‍රදායයි.

මේ වැනි තීන්දු නිසා දේශපාලනයා සමාජයෙන් ඔසවා තබා ඇත්තේ මහජනතාව විසින් ම ය. එපමණක් නොවේ ක්‍රමය සාධාරණ නැති බව දකින යුක්තිය හා සාධාරණත්වය ඇති විය යුතු බවට පෙනී සිටින සමාජයේ ප්‍රබුද්ධ කොටස් පවා ආණ්ඩුව විසින් තමන්ට අවස්ථා සම්පාදනය කළ යුතු බවට සිතන යුගයක් දැන් බිහිවී තිබේ. මෙය අභාග්‍යයකි. අවස්ථා අහිමි පිරිස තව තවත් කම්පාවට පත් කරන සුළු ය.

මෙම විශ්වාසය තහවුරු කර ඇත්තේ සමාජයයි. සමාජයේ වැඩි දෙනෙක් තම විද්‍යමාන තට්ටුවලදී දේශපාලන ඇසුරු ගැසීම අපේක්ෂා කරයි. දේශපාලන හිතවත්කමක් දැන හැඳුනුම්කමක් නැත්නම් තමන්ට අවස්ථා නැති වන බව තදින් විශ්වාස කරන පිරිසක් සිටියි. බැංකු ණයක් ගැනීම වෙනුවෙන් දේශපාලනඥයකු මැදිහත් නොවී මූලික අවශ්‍යතා සපුරාගත නොහැකිය. ඉඩමක් ලබාගැනීමට, උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් වෙනුවෙන් දේශපාලන මැදිහත්වීමක් නොවුණහොත් තමන්ට අභිප්‍රාය පරිදි එය ඉටුවන්නේ නැතැයි සිතන සමාජයක් තුළ අප වේගයෙන් ගමන් කරමින් සිටින්නෙමු. දරුවෙකු පාසලට ඇතුළත් කර ගැනීමේ සිට මිනිසුන්ගේ ජීවිතයේ සෑම අවස්ථාවක දීම දේශපාලනඥයකු හමුවීමට මේ සමාජයේ ඇතැමෙක් උනන්දු ය.

එය යුක්ති සහගත නැත. මෙයට සමාන්තරව ඇතිවන ආකල්පය නම් තමන්ට යම් වාසියක් අවස්ථාවක් උදා කරගන්නට නම් ආණ්ඩුවක් බලයට පත් කළ යුතුය. යන්නයි. එවිට ආණ්ඩු බලයට පත් කරන හා ආණ්ඩු බලයෙන් පහ කරන කණ්ඩායම් වශයෙන් සමාජයේ පුද්ගලයන් එක් එක් පැති වලට බෙදී උපරිම උද්යෝගයෙන් ක්‍රියා කරන්නට පටන් ගනී.

ප්‍රතිපත්ති සහ නීති රීති සකස් කර එම රාමුව තුළ නිසි ලෙස ක්‍රියා කරන්නේ ද යන නිරීක්ෂණය කරන යාන්ත්‍රණයක් පිළිවෙතක් ආණ්ඩුවලට තිබිය යුතු ය. එමෙන්ම පාලනයේ දී යම් අවාසියක් අයුක්තියක් සිදුවන ජන කොටසක් වෙත් නම් ආණ්ඩුව ඒ කෙරෙහි සානුකම්පිතව සලකන පිළිවෙතක් තිබිය යුතු ය.

නීතිය සම්බන්ධයෙන් පවා අපේක්ෂා කළ යුත්තේ එම පසුබිමයි. ආණ්ඩුව කළ යුත්තේ සෑමට සාධාරණත්වය ඇති වන පාලන ක්‍රමයක් ගොඩනැගීමයි. එය කළ හැක්කේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තැබූ බලය යළි සමාජය අතට පැවරීමට ආණ්ඩුව සමත් නම් පමණි. එය කළ හැකි වන්නේ මහජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය තහවුරු කළහැකි නම් පමණකි.

ආණ්ඩුවට හිතවත් පිරිසට අවස්ථාව හිමි වන බව දන්නා නිසාම ආණ්ඩු පත් කරන්නට දේශපාලනඥයන් පසු පස යන පිරිසක් ඇතිවන අවස්ථාවක නිරායාසයෙන්ම ජන සමාජයේ තවත් කොටසක් ආණ්ඩුවෙන් තමන්ට අවස්ථාවක් නොලැබෙන බව සිතන්නට පටන් ගනී. එහින් සිදුවන්නේ අනවශ්‍ය බෙදීම් ඇති වී සමාජය විනාශ වීමයි. දේශපාලන පක්ෂයක් බලයට පත් කිරීමේදී ප්‍රතිපත්ති මත විවාදයක් ගෙන යන්නට අවශ්‍ය වුවත් ආණ්ඩුව පත්වීමෙන් පසු සියලුම දෙනා එකී රට වැසියන්ය.

ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට මහජනතාව සතු බලය වැඩි කරන ක්‍රමවේදයන් අලුතින් එක්විය යුතුය. තොරතුරු දැනගැනීමට ඇති අයිතිය තහවුරු කරන පනත් කෙටුම්පත ඒ අතරින් වැදගත් එකකි. ශ්‍රී ලංකා ජාතික සංගමය සුබවාදී පාලනයක් සඳහා රජය පොළඹවන හා දිරිගන්වන කරුණු දොළහකින් යුත් න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කර තිබේ. තොරතුරු දැනගැනීමේ අයිතිය මහජනතාවට හිමි විය යුතුය යන්න එහි දැක්වෙන එක් ප්‍රධාන යෝජනාවකි.

මේ මහජනතාව දැන ගත යුතු තොරතුරු මොනවාද? යන්න පුළුල්ව සාකච්ඡා කළ යුතුය. රජය විසින් මහජනතාව වෙනුවෙන් විවිධ සංවර්ධන යෝජනා ක්‍රම දියත් කරයි. සැලසුම් සකස් කරයි. මහජන යහපත වෙනුවෙන් කෙරෙන මෙම සියලු දේ සම්බන්ධයෙන් පසුබිම කුමක්දැයි මහජනතාව දන්නේ නැත. විදුලි බලාගාරයක් ඉදිවන විට එහි කොන්ත්‍රාත්තුව පවරන්නේ ප්‍රසිද්ධ සමාගමකට විය හැකිය. සාමාන්‍යයෙන් විපක්ෂය චෝදනා කරන්නේ මෙවැනි කොන්ත්‍රාත් පවරන්නේ දැන හැඳුනුම්කම් අනුව බවය. ඕනෑම ආණ්ඩුවක් මුහුණ දෙන චෝදනාව එයයි. විපක්ෂයේ සිටින පිරිස නිරන්තරව කරන්නේ බලයේ සිටින පක්ෂය කරන ඕනෑම දෙයක් වංචා දූෂණ ඇති බව ප්‍රකාශ කිරීමයි. මෙහි සැබෑව කුමක්ද? විනිවිද භාවයකින් යුතුව තොරතුරු දැනගත හැකි වෙනොත් මහජනතාවට ඇත්ත දැන ගත හැකිය. තමන්ගේ පාරට පාර දැමීම වෙනුවෙන් වෙන් කළ මුදල කුමක්ද? එහි ටෙන්ඩරය පිරිනැමුණේ සාධාරණ අන්දමට ද? ජාතික පාසලට තමන්ගේ දරුවා ඇතුළත් නොවුණේ ඇයිද? තෝරා ගත්තේ සුදුස්සන් ම ද?

මේ සියලු තොරතුරු දැන ගැනීමට මහජනතාවට අයිතියක් තිබේ. මේ පමණක් නොවේ තමන් ගෙවන බදු මුදලින් රජය දියත් කරන ඕනෑම ව්‍යාපෘතියක් ගැන විමසා දැන ගන්නට ලාංකිකයන්ට අයිතියක් ඇත. තොරතුරු දැන ගැනීමේ අයිතිය හිමි වන නව පනත මගින් මෙම අයිතිය නිත්‍යානුකූලව මහජනතාවට ලබාදීම මගින් කරන යෝජනාවයි. එවිට මහජනතාවට රජයේ ක්‍රියාවලිය විනිවිද දැකගත හැකිය. අනවශ්‍ය චෝදනා හා මඩ ගසා ගැනීම් වලින් වළකින්නට ඉඩ තිබේ. එපමණක් නොවේ ආණ්ඩුව ද යථාර්ථවාදීව මහජන සුබ සෙත පිණිස දූෂණ හෝ වංචා වලට ඉඩ නොතබා හසුරුවන්නට පටන් ගනී. එය දඬුවම් දී වැරදි කරන්නන් වැළැක්වීමට වඩා ප්‍රායෝගික ක්‍රමයක් වනු ඇති බව මාගේ විශ්වාසයයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේදී මහජනතාවට විනිවිද පෙනෙන පාලන ක්‍රමයක් ඇති කරන බව හා ඒ සඳහා වන පනත් කෙටුම්පත අලුතින් පත්වන පාර්ලිමේන්තුවේ පළමු යෝජනාව ලෙස ගෙන එන බව දක්වා ඇත. එය ඉතා වැදගත්ය. මෙම අවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් යුක්ති සහගත නව ප්‍රවේශයකි. සමාජය එම යෝජනාව උණුසුම් අන්දමින් පිළිගැනීම ප්‍රජාතන්ත්‍රවාදයේ නිම්වළලු පුළුල් කරන්නකි.

මාගේ ඉල්ලීමට අනුව සිවිල් සමාජයේ ක්‍රියාකාරිකයින් හා මාධ්‍ය ප්‍රධානීන්ගෙන් සමන්විත කණ්ඩායමක් දැනටමත් රජයේ අවධානයට යොමු විය යුතු තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කෙරෙන පනත් කෙටුම්පතක් සාකච්ඡා කිරීමට සකස් කර තිබේ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත හැකි මෙම යෝජනාව ගැන මහජනතාව හා මහජන සංවිධාන පුළුල් සාකච්ඡාවක් ආරම්භ වැදගත්ය. සිවිල් සංවිධාන හා මහජනතාව රජය සමග එක්ව මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට උනන්දු නොවුණහොත් එහා එහි ජයග්‍රහණයක් අපේක්ෂා කළ නොහැකිය. ශ්‍රී ලංකා ජාතික සංගමය ආරම්භ කර ඇත්තේ සෑම පුරවැසියෙකුම හා සංවිධානයක්ම රජයේ ක්‍රියාවලියේ විනිවිද පෙනෙන සුළු බව මගින් සියලු සැලසුම් දියත් කරන වකවානුවක් ඇති කිරීම කෙරෙහි ය. මෙම පනත ක්‍රියාත්මක වුවහොත් රජය හෝ රජයේ පාලනයට යටත් ආයතනවලට මහජනයා ඉල්ලා සිටින තොරතුරු සැපයීමට සිදුවෙයි. එයින් වැළැකීමට ඉඩක් ඇත්තේ ප්‍රවේශම් අවස්ථාවන් ලෙස සලකා නිශ්චිත කාලයකට රජය විසින් ආවරණය කරන අංශ පමණකි. ඒවානම් රාජ්‍ය ආරක්ෂාව, විදේශ ප්‍රතිපත්තිය හෝ පුද්ගලයන් ඉලක්ක කරගත් තොරතුරුවලට ඉඩ තිබේ.

තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ විධිවිධාන ක්‍රියාත්මක වන අවස්ථාව වන විට රාජ්‍ය ආයතනයන්ට විධිමත් සම්ප්‍රදායකට අනුව තොරතුරු ගොනු කරන්නට සිදුවනු ඇත. වාර්තා හා ලිපි ගොනු ආදිය නිසි ලෙස ඉක්මනින් සොයා ගත හැකි ක්‍රමවේදයකට නිශ්චිත කාලයකට ගබඩාකරන්නට සිදුවීම නොවැළැක්විය හැකිය. ඕනෑම ව්‍යාපෘතියක මහජනතාවට දැනගත යුතු තොරතුරක් නිවැරදිව ලබාදීමට හැකිවීම සම්බන්ධයෙන් වගකීම උසුලන්නට විශේෂ භාර අමාත්‍යවරයකට සිදුවනු ඇත.

රජයේ දෙපාර්තමේන්තු හෝ රජයට අයත් ආයතනවල තොරතුරු සැපයීම නිලධාරීවරයෙකුගේ සේවය මේ අනුව අත්‍යවශ්‍ය වනු ඇත. ඔහුගේ වගකීම වනු ඇත්තේ ඉල්ලා සිටි අවස්ථාවක නිවැරදි තොරතුරු නිශ්චිත කාලසීමාවක් තුළ ලබාදීමයි. ඉල්ලා සිටින තොරතුරු සැපයීම තමන් විෂයය පරයක් හා බැඳී ඇත්නම් තොරතුරු නිලධාරියා විසින් ඒ බව නොපමාව දක්වා එහි පාර්ශ්වයන්ද දක්වා ලබාගැනීමට සිදුවන බව දැනුම්දීම ද නීතිය මගින් තහවුරු කළයුතුය. යම් පසුබිමක් මත තොරතුරු සැපයීම පසෙක තබනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් තොරතුරු දැන ගැනීමේ අයිතිය සම්බන්ධයෙන් පිහිටුවන විශේෂ කොමිසමට පැමිණිලි කරන්නට අයදුම්කරුවන්ට අවකාශයක් ලැබේ. මෙම පැමිණිල්ල අනුව පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගැනීමට කොමිසමට සම්පූර්ණ බලය ලැබෙනු ඇත.

මෙතෙක් පැහැදිලි වන්නේ දැනුම බලය බවට පත්වන බවයි. මෙතෙක් කල් දේශපාලනඥයන් විසින් මහජනතාව වෙත විවිධ අන්දමට පතුරුවන මත ගැන ඇත්ත දැනගත හැකි වන බවයි. දේශපාලනඥයන් මෙතෙක් පවරා දී තිබෙන සියල්ල දන්නා බව පෙන්වන බලය යළි මහජනතාවටත් දැනුම කේන්ද්‍රයට ගත් සමාජයකට පැවරීම තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ පනත ක්‍රියාත්මක වීමත් සමග සමාජයට ලැබෙන සුවිශේෂී අවස්ථාවයි. එය ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ මහජනතාවට ලැබෙන පැහැදිලි දියුණු අවස්ථාවකි.

ලෝකයේ රටවල් ගණනාවක් දැනටමත් ස්වකීය මහජනතාවට මෙම තොරතුරු දැනගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර දී තිබේ. ඉන්දියාව, බංගලාදේශය හා පාකිස්තානය වැනි රටවල් මේ හා සමාන නීති රීති ගෙනැවිත් ඇති අතර චීනය, කොරියාව, තායිලන්තය හා ජපානය වැනි ආසියාතික රටවලද තොරතුරු දැනගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර ඇත. ඉන්දියාවේ දැනට ක්‍රියාත්මක වන මෙම පනත අනුව මහජනතාවගෙන් නැගෙන ඉල්ලීම් ගැන දිනපතාම පාහේ වාර්තා වෙයි. ඉන්දීය ජාතික සමිතිය උළෙලට තෝරාගත් ව්‍යාපාරික පසුබිමක් සහිත පුද්ගලයකුගේ සුදුසුකම් හා ඔහු තෝරා ගැනීමට දේශපාලන බලපෑම් එල්ල වූයේ ද යන්න පසුගිය කාලයේ මහත් උණුසුම් සහගත මාතෘකාවක් විය. අවසානයේ එම තෝරාගැනීමට දේශපාලනඥයින්ගේ නිර්දේශ තිබුණු බව අනාවරණය වූ අතර එය තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් පොදු මහජනතාව වරප්‍රසාද හිමි කරගත් සුවිශේෂී අවස්ථාවක් ලෙස ඉන්දීය දේශපාලනයේ වාර්තා විය.

තවත් විමසා බලන විට බටහිර යුරෝපීය රටවල ද තොරතුරු දැනගැනීමට ඉඩ ලැබෙන අණ පනත් සම්මත කර තිබේ. කැනඩාව, මෙක්සිකෝව, චිලී, කොලොම්බියාව හා ඇමෙරිකාව එයින් කිහිපයකි. තොරතුරු දැන ගැනීමට මහජනතාවට ඇති අයිතිය සම්බන්ධව ශ්‍රී ලංකාවට අත්දැකීමක් ලබා ගන්නට උචිතම අවස්ථාව දැන් උදාවී ඇතැයි යන්න පිළිගත යුතුය. එයට හේතුව ඇත්තේ දශක තුනක පමණ කාලයක් බිහිසුණු ත්‍රස්තවාදය හමුවේ හෙම්බත් වී සිටි ලාංකිකයන් එකී අඳුරෙන් මිදී අරුණාලෝකය ලබමින් සිටීමයි. යුද්ධය පැවති කාල පරිච්ඡේදයක එහි ජයග්‍රහණය විනා වෙනත් අවශ්‍යතා කරා යොමු වන්නට ප්‍රජාතන්ත්‍රවාදී සමාජය උනන්දු නැත. දැන් උදාවී ඇති සාමකාමී වකවානුව ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම් යළි ගොඩනගන්නට සුදුසුම යුගයයි.

ශ්‍රී ලංකා ජාතික සංගමය තොරතුරු දැන ගැනීමේ අයිතිය මහජනතාවට ලබාදීමට විශාල උනන්දුවක් දක්වන්නේ මහජනතාව අතට බලය ලැබීම ප්‍රජාතන්ත්‍රවාදයේ දී අපේක්ෂා කළ හැකි ඉහළම ශක්තිය වන හෙයිනි. මහජනතාව විසින් මහජන නියෝජිතයන්ට හෝ ආයතනවලට බලය පවරනවාට වඩා තමන් අතටම විනිවිද පෙනෙනසුළු බව සහිත එවැනි ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙත කරා යොමු කරන්නට හැකි නම් එය ශ්‍රී ලාංකික පොදු මහජනතාවට ලැබෙන උත්තරීතර අවස්ථාවකි.